

# ඕලූලී

ජානකී සූරියආරච්චි



කතාව චිත්‍ර පරිගණක අක්ෂර සහ පරිගණක වර්ණ සංයෝජනය

**ජානකී සූරියආරච්චි**

**ස්තුතිය !**

මගේ පොත් වල අඩුපාඩු නොබැලුවද නිතරම මා ළඟ හිඳිමින් මගේ සියලු දුක සැප බලන මගේ ආදර අම්මාටත්, මා ඉල්ලන, හැකි සියලු දේ මට ලබාදෙන මගේ ආදර තාත්තාටත්, "හරිම කරදරේ" කියමින් වුවද, මට නිරතුරුවම උදව් කරන (මගේ එකම පොතක් වත් කියවා නැති) මගේ ආදර මල්ලීටත්, මට අකුරු කියාදී මඟ පෙන්වූ මගේ ආදර ආච්චීටත්, මට සෙවනැල්ලක් මෙන් සිටින මගේ ආදර ලොකු අම්මාටත්, මගේ කතන්දර කියවා අඩුපාඩු පෙන්වාදෙන මගේ ආදර මිතුරු මිතුරියන්ටත්, භාෂාවේ මා නොදත් දේ මට හොඳින් කියාදුන් මහාචාර්ය ජේ. බී. දිසානායක මහතාට හා මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මියටත්, කලට වේලාවට මුද්‍රණ කටයුතු නිමකර දුන් පාලිත පෙරේරා මහතාටත්, වචනයකින් හෝ මා දිරිමත් කළ සියලුම දෙනාටත් මාගේ හෘදයංගම ස්තුතිය !

**ජානකී සූරියආරච්චි**
1490/8, හෝකන්දර පාර,
පන්නිපිටිය.
Tel: 94-11-2847438

© ජානකී සූරියආරච්චි
ISBN: 955-1090-14-4
**Book Ref: T/05/115**

# ඕලු මලී



ඕලුමලී ලස්සන පුංචි සුරංගනාවියක්.
එයා හිටියෙ ඈත අහසෙ සුරංගනා ලෝකෙ.
ඕලුමලී හරිම ලස්සනයි, අහිංසකයි. ඒ වගේම හරි හොඳයි.
එයාගෙ හොඳ ගති ගුණ නිසා සුරංගනා ලෝකෙ හැමෝම
එයාට ආදරෙයි.
ඒ හොඳ ගති ගුණ නිසාම ඕලුමලී දවසින් දවස තව තවත් ලස්සන වුණා.



මේ සුරංගනා ලෝකෙ හිටියා තවත් ලස්සන සුරංගනාවියක්.
එයාගෙ නම නපුරුමලී.
එයා කොයි තරම් ලස්සන වුණත් සුරංගනා ලෝකෙ කවුරුත් එයාට ආදරේ කළේ නෑ. ඒ, එයා නපුරු නිසා. එයාගෙ මේ නපුරු ගති ගුණ නිසා, දවසින් දවස එයාගෙ ලස්සන අඩු වෙන්න පටන් ගත්තා.
නරක ගතිගුණ නිසා නපුරුමලීගෙ ලස්සන අඩු වෙනකොට, හොඳ ගතිගුණ නිසා ඕලුමලීගෙ ලස්සන වැඩි වුණා.
මේ නිසා නපුරුමලී, ඕලුමලී එක්ක හිටියෙ හරිම තරහින්. ඒ වගේම ඊර්ෂ්‍යාවෙන්. ඇයි? ඕලුමලී නැත්නම් සුරංගනා ලෝකෙ ලස්සනම සුරංගනාවිය වෙන්නෙ නපුරුමලී නෙ.



මෙහෙම නිතරම තරහින් ඊර්ෂ්‍යාවෙන් ඉන්නකොට නපුරුමලීගෙ ලස්සන තව තවත් අඩු වුණා.
"ඕලුමලී නැත්නම් මට මේ සුරංගනා ලෝකෙ ලස්සනම සුරංගනාවිය වෙන්න තිබුණා නෙ. මේකට මම මොකක් හරි කරන්න ඕනෙ."
නපුරුමලී ඊර්ෂ්‍යාවෙන් හිතුවා.
"ඕලුමලී රවටලා සුරංගනා ලෝකෙන් එළියට ගෙනිහින් අතරමං කරලා දැම්මා නම් හරි. එතකොට මං තමයි ලස්සනම!" නපුරුමලීට නපුරු අදහසක් ආවා.
ඊට පස්සෙ එයා ගිහින් ඕලුමලී එක්ක ටිකෙන් ටික යාළු වුණා.
ටික දවසක් යනකොට එයා කොහොම හරි ඕලුමලීගෙ හොඳම යාළුවා වුණා.
නපුරුමලීගෙ හිතේ තිබුණු දේ ඕලුමලී දන්නෙ නැහැ නෙ !



ඉතින් එක දවසක් ඕලුමලී මල් උයනේ මල් නෙලමින් ඉන්නකොට
නපුරුමලී එතනට ආවා.
"මීට වඩා ගොඩක් ලස්සන මල් තියෙන තැනක්
මම ඔයාට පෙන්වන්න ද?" නපුරුමලී ආදරෙන් වගේ ඇහුවා.
"මීට වඩා ලස්සන මල්? කෝ කොහෙද තියෙන්නෙ?
අනේ මට පෙන්වන්නකෝ." ඕලුමලී කීවා.
"එහෙනම් එන්න මා එක්ක යන්න. මං ඔයාට ලස්සනම ලස්සන
මල් වත්තක් පෙන්වන්නම්කෝ." නපුරුමලී කීවා.



ඕලුමලී හරි සතුටින් නපුරුමලී එක්ක
සුරංගනා ලෝකෙන් පියාඹලා ගියා.
හඳ අතරින්, තරු අතරින්, වළාකුළු අතරින්
පියාඹලා අපේ ලෝකෙට ආවා.
ඊට පස්සෙ කඳු අතරින් ගංගා උඩින් පියාඹලා ගිහින් එක කැලෑවකට
ඕලුමලී එක්කගෙන ගියා.

ඒ කැලේ ලස්සන ලස්සන මල් පිරිලා තිබුණා.
"අනේ, හරිම ලස්සනයි!" ඕලුමලී සන්තෝසෙන් හිනා වුණා.
නපුරුමලී ලස්සන මල් පෙන්වමින් කැලේ පුරාම ඕලුමලී එක්කගෙන ගියා.
එයා හිතේ හැටියට පියාඹලා ගිහින් මල් නෙළුවා.
මහන්සි දැනෙන කල් මල් නෙළුවා.



මෙහෙම ගිහින් අන්තිමට නපුරුමලී, කැලේ මැද තිබුණු පොකුණක් ළඟට ඕලුමලී එක්කගෙන ආවා.
ඒ වෙනකොට ඕලුමලීට ගොඩක් මහන්සියි
"ඕලුමලී, දැන් අපි අපි වතුර ටිකක් බීලා ඉඳිමු නේද?"
නපුරුමලී ආදරෙන් වගේ කීවා.
"ඔව්, අපි වතුර ටිකක් බොමු." ඕලුමලීත් කීවා.
ඊට පස්සෙ දෙන්නා එක්ක පොකුණ අද්දරට ආවා.
ඕලුමලී වතුර ටිකක් අරගන්න හෙමින් පොකුණට නැමුණා.



"ජබෝස්!"
නපුරුමලී එකපාරටම අහිංසක ඕලුමලී
පොකුණට තල්ලු කරලා දැම්මා.
"ආහ්! අයියෝ!"
අනේ ඕලුමලී දිය යට ගිහින් පොකුණු මඬේ එරුණා.
එයාට ගොඩට එන්න බැරි වුණා.



"හග් - හග් හා - හා - හා-දැන් හරි!"
නපුරුමලී හයියෙන් හිනා වෙලා ආපහු යන්න හැරුණා විතරයි!
"ජබෝස්!"
නපුරුමලීත් කකුල ලිස්සලා ඒ පොකුණටම ඇදගෙන වැටුණා.



"අයියෝ----" නපුරුමලී කෑ ගැසුවා.

ඒ එක්කම, එකපාරටම, නපුරුමලීගෙ පාට වෙනස් වුණා. ඇඟ කළු පාට වෙලා ගල් ගැහුණා. ඊටපස්සෙ ටිකෙන් ටික මහා කළු ගලක් බවට පත් වුණා. හෙලවෙන්නවත් බැරි වෙන්න පොකුණ අද්දර මඩේ එරුණා.

"අනේ අයියෝ මාව බේරගන්න කවුරුත් නැද්දෝ" නපුරුමලී කෑ ගැසුවා.

ඒත් එයාගෙ හඬ කාටවත් ඇසුණේ නෑ.

එයා කළ නපුරු වැඩේට එයාට එවෙලේම දඬුවම් ලැබුණා.

සුරංගනා ලෝකෙ ලස්සනම සුරංගනාවිය වෙන්න හිතූ නපුරුමලීට අන්තිමට පොකුණක් අද්දර කළු ගලක් බවට පත් වෙන්න වුණා.

සීතල වතුරේ ගලක් වෙලා, කතා කරගන්නවත් බැරුව, නපුරුමලී බලාගෙන හිටියා.



ඔන්න ඔය අතරෙදි ටිකෙන් ටික රෑ වුණා. රෑ කළුවර වැටී ගෙන එනකොට ඕලුමලීගෙ ලස්සන මූණ, ටිකෙන් ටික පොකුණු දියෙන් උඩට මතු වුණා.
"අනේ, කෝ මගේ යාළුවා?" ඕලුමලී යාළුවා සොයමින් වටපිට බැලුවා. ඒත් එයා ළඟම පොකුණ අද්දර ගලක් වෙලා මඩේ එරිලා යාළුවා බලාගෙන ඉන්න හැටි එයා දැක්කෙ නෑ. එයා වටපිට බලමින් යාළුවා සොයමින් අඬන්න පටන් ගත්තා.
යාළුවාට වුණු දේත්, යාළුවා එයාට කළ දේත් එයා දන්නෙ නැහැ නෙ.



ටික වෙලාවකින් හතරවටේම කළුවර වුණා. බලන බලන අත කවුරුවත් පෙනෙන්න හිටියෙ නෑ. පුංචි කුරුල්ලෙක්, සමනලයෙක්වත් පෙනෙන්න නෑ.
ඕලුමලීට හොඳටම බය හිතුනා.
එයා මඩේ හිරවෙලා සීතලේ ගැහි ගැහී හිටියා.
මහ කැලේක පොකුණක් මැද්දෙ පාළුවේ, කළුවරේ, තනිවෙලා!
ඕලුමලී හොඳටම ඇඬුවා. ඉකි ගහමින් ඇඬුවා.
ඕලුමලීගෙ ඇස් දෙකේ කඳුළු පිරිලා ඉතිරුණා.
ඒ කඳුළු කම්මුල් දිගේ ගලාගෙන ගියා.
ඒත් ඒ එක්කම ඒ කඳුළු පුරවාගෙන සුදු පාට පුංචි මල් පෙති ඕලුමලීගෙ ලස්සන මූණ වටේට මතු වුණා. ඕලුමලී අඬන කඳුළු වතුරට වැටෙන්න නොදී ඒ මල් පෙති උඩ පිණී කැට වගේ රඳවා ගත්තා. සීතල නො දැනෙන්න, ඒ මල්පෙති ඕලුමලී වහගෙන පොරවා ගත්තා. ඊට පස්සෙ ඕළුමලීට අඬ අඬාම නින්ද ගියා.



පහුවදා උදේ හතර වටින් ඇසුණු "කීච්-බීච්" සද්දෙට ඕලුමලී ඇහැරුණා.
එයා වටපිට බැලුවා.
කන්ද උඩින් ඉර පායාගෙන එනවා.
"ආ, අලුත් දවසක්!" ඕලුමලීට හරි සතුටුයි.
ඉර පායනකොට ඕලුමලී ඉරත් එක්ක සන්තෝසෙන් හිනා වුණා.
ඕලුමලී හිනා වෙනකොට මල් පෙති ටික ලස්සනට විහිදුනා.
ඒ මල් පෙති විහිදෙනකොට ඕලුමලී ලස්සනම ලස්සන ඕලු මලක් වුණා.
එයා රෑ පුරාම ඇඬු කඳුළු, බිංදු බිංදු මල් පෙති උඩ රැඳුනා.
මල් පෙති උඩ රැඳිලා තිබුණු ඒ කඳුළු ඉර එළියට මුතු කැට වගේ දිලිසුණා.
ඕලු මලේ සුවඳ සුළඟට එකතු වෙලා හැම තැනම සුවඳ හමන්න පටන් ගත්තා.
ඈත එපිට ඉඳන් පුංචි සමනල්ලු, මී මැස්සො, බඹරු ඒ සුවඳට ඇදිලා ආවා.
ඕලුමලීට දැන් යාළුවෝ ගොඩයි.
"දැන් නම් මට පාළු නෑ." ඕලුමලී සතුටින් හිනා වුණා.
මේ අතරේ නපුරුමලී පොකුණ අද්දර මඩේ හිරවෙලා, ඊර්ෂ්‍යාවෙන් ඒ දිහා බලාගෙන හිටියා. එයා ළඟට පුංචි සමනලයෙක්වත් ගියේ නෑ.
"ඕලුමලී මඩේ හිටියත් ලස්සනයි, කොහේ ගියත් හැමෝම ආදරෙයි.
ඇයි මට කවුරුත් ආදරේ නැත්තෙ?"
නපුරුමලී තනිවම කල්පනා කළා



එදා ඉඳලා හැමදාමත් ඕලුමලී රෑ වෙනකොට, කළුවරේ සීතලේ මැළවෙනවා.
මල්පෙති වලින් මූණ වහගෙන රෑ පුරාම අඬනවා.
ඒත් පහුවදා උදේ ඉර පායනකොට, ලස්සනට පිපිලා සතුටින් හිනා වෙනවා.
එතකොට රෑ පුරාම ඇඬූ කඳුළු මුතු කැට වගේ දිලිසෙනවා.
ඕලුමලීගෙ ලස්සන බලන්න ඉරත් හරි ආසයි.
සමනල්ලු, මී මැස්සො, හැමෝම ඕලුමලීට හරි ආදරෙයි.
එයාලා ඕලුමලී වට කරගෙන හිනා වෙනවා.
කුරුල්ලො කිචි බිචි ගාමින් සිංදු කියනවා.
එයා ඒ සිංදු අහමින් සිනා වෙමින් සුළගේ නැළවෙනවා.
"ඇත්ත තමයි, හිත හොඳ නම් කොතන ගියත්
සතුටින් ඉන්න පුළුවන්. හැමෝම ආදරේ වෙනවා.
ඒත් නපුරු කම් කළොත් හැමදාම ඉන්න වෙන්නෙ දුකෙන්!"
ඒ දිහා බලාගෙන නපුරුමලී හැමදාම හිතනවා.





.....ඔන්න ඔහොම තමයි ඕලුමල් හැදුනේ.

